THE INSTITUTE OF CHARTERED ACCOUNTANTS OF SRI LANKA

SUGGESTED SOLUTIONS

NOT FOR SALE

KE3 – Fundamentals of Taxation and Law

2015 මාර්තු

All Rights Reserved

A කොටස

බදුකරණය

<u>1 වන කොටස</u>

<u>පිළිතුර 01</u>

1(a)

1.1

අදාල ඉගෙනුම් ඵලය : 4.1.1
නිවැරදි පිළිතුර : C

1.2

අදාල ඉගෙනුම් ඵලය : 1.1.2
නිවැරදි පිළිතුර : B

1.3

අදාල ඉගෙනුම් ඵලය : 4.5.2
නිවැරදි පිළිතුර : B

1.4

අදාල ඉගෙනුම් ඵලය : 5.1.1
නිවැරදි පිළිතුර : A

1.5

අදාල ඉගෙනුම් ඵලය : 5.2.1
නිවැරදි පිළිතුර : C

[1(a)(MCQs) = මුළු ලකුණ **10]**

NOT FOR SALE

1(b)

1.6

අදාල ඉගෙනුම් ඵලය : 2.4.3		
දළ ආදායම් බදු බැදියාව		1,150,000
බදු බැර		
උ.වි.ගෙ (PAYE)	400,000	
ස්වතක්සේරු යටතේ ගෙවීම්	<u>120,000</u>	<u>520,000</u>
ගෙවිය යුතු ඉතිරි බද්ද		<u>630,000</u>

පොල ආදායමෙන් හා ලාභාංශ ආදායමෙන් අඩුකර ඇති බද්ද අවසාන බද්දයි. එහෙයින් රඳවා ගැනීමේ බදු, බදු බැර ලෙස ගත නොහැකිය.

1.7

අදාල ඉගෙනුම් ඵලය : 2.4.4	
බෙදිය හැකි ලාභය	7,570,000
ශුද්ධ කුලිය	<u>1,350,000</u>
	8,920,000
හවුල් ව්‍යාපාර සඳහා බදු නිදහස් දීමනාව	<u>(1,000,000)</u>
බද්දට යටත් ආදායම	<u>7,920,000</u>
8% බැගින් ගෙවිය යුතු බද්ද	<u>633,600</u>

1.8

අදාල ඉගෙනුම් ඵලය : 3.1.1

අදාල බදු අනුපාතය 28% කි.

සීමිත ටෝයිස් (පෞද්) සමාගම උප සමාගමකි. එහෙයින් පිරිවැටුම් ප්‍රමාණය හෝ බදුවන ආදායමට අදාල වන අඩු බදු අනුපාතයන්, අදාල නොවේ.

NOT FOR SALE

1.9

අදාල වන ඉගෙනුම් ඵලය : 5.1.3
ජාතිය ගොඩනැගීමේ බදු පණතෙහි උපලේඛණයේ පලමුවන කොටසේ දක්වා ඇති ඕනෑම භාණ්ඩ දෙකක්. උදාහරණ : නිෂ්පාදකයෙකු විසින් අපනයනය කරනු ලබන ඕනෑම භාණ්ඩයක් පොහොර අධ්‍යයන පෙළපොතෙහි හෝ ජාතිය ගොඩනැගමේ බදු පණතෙහි උපලේඛණයේ පලමුවන කොටසේ සඳහන් කර ඇති වෙනත් ඕනෑම අයිතමයක් පිලිගත හැකිය.

1.10

අදාල වන ඉගෙනුම් ඵලය : 5.2.2
සැපයීමක්, ශුන්‍ය අනුපාත සැපයමක් යන්නෙන් අදහස් කරනුයේ සැපයිම් බද්දට යටත් වන නමුත් බදු අනුපාතය ශූන්‍ය වේ. සැපයීමක් නිදහස් සැපයීමක් වන්නේ නම්, එම සැපයීම එකතු කළ අගය මත (VAT) බද්දට යටත් නොවේ. ශුන්‍ය අනුපාත සැපයීම්වලදී කෙනෙකුට තමා විසින් දරන ලද යෙදවුම් බද්දට හිමිකම් ඇති අතර නිදහස් සැපයීම් වලදී කෙනෙකුට තම සැපයීම් සඳහා එ.අ.බ. අයකල නොහැකි නිසා යෙදවුම් බද්දට හිමිකමක් නැත.

[1(b) = මුළු ලකුණු 10]

NOT FOR SALE

2 වන කොටස

<u>පිළිතුර 02</u>

අදාල ඉගෙනුම් ඵල :	2.2, 2.3, 2.4

පීටර් මහතා - 2013/14 තක්සේරු වර්ෂය සඳහා
දළ ආදායම් බද්ද හා ගෙවිය යුතු ඉතිරි බද්ද ගණනය කිරීම.

	රුපි.	
සේවා නියුක්ති ආදායම		
දළ වැටුප (250,000 *12)	3,000,000	
වාහන දීමනාව (105,000 *12) 1,260,000		
අඩුකලා: මසකට 50,000 බැගින් (නිදහස්) (600,000)	660,000	
සංග්‍රහ දීමනාව 20,000 x 12	240,000	
ප්‍රතිපූරණය කරන ලද දුරකථන බිල්පත් 172,000 x 50%	86,000	
සේවා යෝජකයා විසින් අනුමත සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවීම	-	
		3,986,000
ශුද්ධ ලාභාංශ ව්‍යවස්ථාපිත ආදායමේ කොටසක් ලෙස සලකනු නොලැබේ		-
ලැයිස්තුගත කොටස් අලෙවියෙන් ලැබූ ලාභය බදු නිදහස් වේ. (කොටස් ගණුදෙනු සඳහා ගෙවා ඇති බැවින්)		-
කුලී ආදායම		
ලැබූ දළ කුලිය (140,000 x 12)	1,680,000	
අඩුකලා : වරිපනම්	(32,000)	
	1,648,000	
අඩුකලා : 25% අලුත්වැඩියා දීමනාව	(412,000)	
ශුද්ධ කුලිය	1,236,000	
ශු.වා.අ. = වා. ත - අලුත්වැඩියා දීමනාව (160,000 - 40,000 = 120,000)		
ශුද්ධ වාර්ෂික කුලිය ශු.වා.අ. වඩා වැඩිය.		**1,236,000**
ව්‍යාපාර ආදායම		
ගිණුම් අනුව ශුද්ධ ලාභය	1,742,000	
එකතුකලා : ඉඩ නොදෙන අයිතමයන්		
විදේශ ගමන් වියදම්	689,000	
සංග්‍රහ වියදම්	67,000	
පොත් අගයට ක්ෂය කිරීම් - පරිගණක	160,000	
- ඡායා පිටපත් යන්ත්‍ර	75,000	
	2,733,000	

පරිගණක සඳහා ප්‍රාග්ධන දීමනා (480,000 X 25%)			(120,000)	
ගලපන ලද ලාභය				**2,613,000**
මුළු ව්‍යවස්ථාපිත ආදායම				**7,835,000**
අඩුකලා : <u>32 වන වගන්තිය යටතේ අඩු කිරීම්</u>				
මහල් නිවසක් මිලට ගැනීම සඳහා ලබාගත් ණයමුදල් සඳහා ගෙවූ පොලී අඩුකිරීමට ඉඩදෙනු ලැබේ				(850,000)
සටහන : (සේවා නියුක්ත ආදායමෙන් කිසිවක් අඩුකල නොහැකිය කෙසේ වෙතත් වෙනත් මුලාශ්‍රවලින් ලැබූ ප්‍රමාණවත් ලාභයක් ඔහු සතුව ඇති බැවින් පොලී ගෙවීම අඩුකල හැකිය.)				
තක්සේරු කල හැකි ආදායම				**6,985,000**
අඩුකලා : සුදුසුකම් ලබන ගෙවීම්				(100,000)
සේවා නියුක්ත ආදායම සුදුසුකම් ලබන ගෙවීමක් නොවේ.				-
ජීවිත රක්ෂණ වාරිකය රු. 150,000 (රු. 75,000 හෝ තක්සේරු වන ආදායමෙන් 1/3 යන දෙකෙන් අඩු මුදල)				(75,000)
ණය ආපසු ගෙවීම සුදුසකම් ලබන ගෙවීමක් නොවේ.				-
පෞද්ගලික දීමනාව				(500,000)
සටහන : (සේවා නියුක්ත ආදායමෙන් කිසිවක් අඩුකල නොහැකිය. කෙසේ වෙතත් වෙනත් මුලාශ්‍රවලින් ලැබූ ප්‍රමාණවත් ලාභයක් ඔහු සතුව ඇති බැවින් ජීවිත රක්ෂණ ඔප්පුව සඳහා ගෙවූ රක්ෂණ වාරිකය අඩුකල හැකිය.)				
බදු අය කල හැක ආදායම				**6,310,000**
ගෙවිය යුතු දල ආදායම් බද්ද				
	500,000	4%	20,000	
	500,000	8%	40,000	
ව්‍යාපාර ආදායම	**2,613,000**	**10%**	**261,300**	
	500,000	12%	60,000	
	500,000	16%	80,000	
	1,000,000	20%	200,000	
	<u>697,000</u>	24%	<u>167,280</u>	
	<u>6,310,000</u>		<u>828,580</u>	
ගෙවිය යුතු දල ආදායම් බද්ද				828,580
අඩුකලා : බදු බැර				
උ.වි.ගෙ. (PAYE)			841,800	
ස්වතක්සේරු ක්‍රමය යටතේ ගෙවීම්			150,000	
				(991,800)
ගෙවිය යුතු / ලැබිය යුතු) ඉතිරි බදු මුදල				(163,220)

(මුළු ලකුණු 20)

NOT FOR SALE

B කොටස

නීතියේ මූලිකාංග

<u>1 වන කොටස</u>

<u>පිළිතුර 01</u>

1(a)

1.1

අදාල ඉගෙනුම් ඵලය: 1.3.1.
පිළිතුර : C
ශ්‍රී ලංකාවේ මූලික අයිතිවාසිකම් පිළිබඳ නඩු ඇසීමට බලය ඇත්තේ ශ්‍රේෂ්ඨාධිකරණයට පමණ.

1.2

අදාල ඉගෙනුම් ඵලය: 3.1.1
පිළිතුර : C
වාචිකව පාර්ශවයන්ගේ ක්‍රියාවලින්, හැඟවීමෙන් හා කොටසක් ලිඛිතව හා කොටසක් වාචිකවද ගිවිසුමක් සකස්කර ගත හැකිය.

1.3

අදාල ඉගෙනුම් ඵලය: 4.3.1
පිළිතුර : B
ඉදිරිපත් කිරීමේදී බිල්පත අගරුවේයයි විශ්වාස කිරීමට බිල්පත ධාරකට හේතුන් ඇති නිසාම බිල්පතක් ගෙවීම සඳහා ඉදිරිපත් කිරීමේදී අනුගමනය කල යුතු අවශ්‍යතාවයන්ගෙන් බැහැරවීමට කරුණක් නොවේ.

1.4

අදාල ඉගෙනුම් ඵලය: 5.3.1
පිළිතුර : A
ප්‍රධානියා විසින් බලය පවරා ඇත්නම් මිස නියෝජිතයා විසින් තම අධිකාරි බලය කිසිවකුට නොපැවරිය යුතු බවට නියෝජිතයා සතු යුතුකමක් ඇත.

1.5

අදාල ඉගෙනුම් ඵලය: 8.1.1
පිළිතුර : D
මෙම පණත අදාල වන්නේ ශ්‍රී ලංකාව තුලදී සිදුකරනු ලබන කටයුතුවලට මිස ශ්‍රී ලංකාවෙන් පිටතදී සිදුකරනු ලබන කටයුතු වලට නොවේ.

[1(a)(MCQs) = මුළු ලකුණු **10]**

NOT FOR SALE

1(b)

1.6

අදාල ඉගෙනුම් ඵලය : 1.4.1 / 1.4.2
ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාර ආයතනය ක්‍රියාත්මක කරනු ලබන නියාමන කාර්යභාරයන් හා එහි ප්‍රධාන කාර්යයන් පහත පරිදි වේ. - ආයතනයේ සාමාජිකයන්ට අදාල වෘත්තීය ප්‍රමිති ලියාපදිංචි කිරීම, පාලනය කිරීම හා නඩත්තු කිරීම. - රටතුල <u>විගණන</u> හා <u>ගණකාධිකරණ</u> වෘත්තියන් විධිමත් කිරීම.

1.7

අදාල ඉගෙනුම් ඵලය : 2.1.1
නීත්‍යානුකූලව වගකීමකට බැදෙන ගිවිසුමක් ඇතිකර ගැනීමට අත්‍යාවශ්‍ය වන ප්‍රධාන අවශ්‍යතාවයන් පහත පරිදි වේ : (අ) වලංගු අර්පනයක් තිබිය යුතුය. (ආ) වලංගු ප්‍රතිග්‍රහණයක් තිබිය යුතුය. (ඇ) පාර්ශවයන්ට නිත්‍යානුකූල බැදෙන සම්බන්ධතාවයක් ඇති කිරීමේ අරමුණක් තිබිය යුතුය. (ඈ) ගිවිසුමේ කොන්දේසි නිශ්චිත විය යුතුය. (ඉ) ගිවිසුම ඉටුකල හැකි එකක් විය යුතුය. (ඊ) පාර්ශවයන් අතර අව්‍යාජ කැමැත්තක් හෝ එකඟතාවයක් තිබිය යුතුය. (උ) පාර්ශවයන් ට ගිවිසුම් සඳහා ශක්‍යතාවයක් තිබිය යුතුය. (ඌ) ගිවිසුමේ පර්මාර්ථය නිත්‍යානුකූල විය යුතුය. (එ) ප්‍රතිෂ්ඨාව/ සාධාරණ හේතුව (Justa Causa) (යම්කිසි විශේෂ ගිවිසුමකට අදාල වන්නේ ඉංග්‍රිසි නීතිය/ නැතිනම් රෝම ලන්දේසි නීතියද යන්න පදනම් කරගෙන) (ඒ) අදාල ව්‍යවස්ථාව විසින් නියමකර ඇති ආකෘතියට අදාල විය යුතුය.

NOT FOR SALE

1.8

අදාල ඉගෙනුම් ඵලය : 4.1.2
ගණුදෙනු කල හැකි ලියකියවිල්ලකට තිබිය යුතු ප්‍රධාන ගති ලක්ෂණ පහත පරිදි වේ. (අ) ගණුදෙනු කලහැකි ලියකියවිල්ලේ හිමිකම (එය ධාරක ලියකියවිල්ලක් නම්) භාරදීමෙන් හා (එය විධාන ලියකියවිල්ලක් නම්) පිටසන් කර භාරදීමෙන් පැවරිය හැකිය. (ආ) ගණුදෙනු කලහැකි ලියකියවිල්ලක ධාරකට සිය නමින්ම නඩු පැවරිය හැකිය. (ඇ) බිල්පත පැවරීමකදී එයට සම්බන්ධ වගකිවයුත්තාට දැනුම්දීමේ අවශ්‍යතාවයක් නැත. (ඈ) සද්භාවයෙන් යුතුව වටිනාකමට බිල්පතක් ලබාගත් ධාරකයෙකුට තම පූර්වගාමීන්ගේ හිමිකම්වල පැවති දෝෂවලින් නිදහස් නිසිහිමිකමක් ලැබෙනු ඇත.

1.9

අදාල ඉගෙනුම් ඵලය : 6.1.1
රක්ෂණ ගිවිසුමක් හා පරදු ගිවිසුමක් අතර ඇති ප්‍රධාන වෙනස්කම් පහත පරිදිවේ. (අ) රක්ෂණ ආවරණයක් ලබාගන්නේ තමා සතු දෙයක් ආරක්ෂාකර ගැනීමට වන නමුත් පරදු ගිවිසුමකදී යමෙකු වාසියක් හෝ ජයග්‍රහණයක් අත්කරගැනීමට උත්සාහ කරයි. (ආ) රක්ෂණයේදී රක්ෂණය කරනු ලබන දෙය පිළිබදව රක්ෂණ හිමිකමක් තිබිය යුතු අතර ඔට්ටු ගිවිසුමකදී ඕනෑම දෙයකට ඔට්ටු ඇල්ලීමට හැකියාව ඇත. (ඇ) රක්ෂණ ගවිසුමක් නීතිය ඉදිරියේ බලාත්මක කල හැකි වුවත් ඔට්ටු ගිවිසුමක් නීතිය ඉදිරියේ බලාත්මක කල නොහැකිය. (ඈ) ජීවිත රක්ෂණයෙදී හැර සාමාන්‍යයෙන් එකම විෂය වස්තුවක් හෝ අවදානමක් රක්ෂණ කරුවන් දෙදෙනකු සමග රක්ෂණය කල නොහැකි වුවත් ඔට්ටු ඇල්ලීමේදී එකම දෙයකට බුකිකරුවන් එක් අයෙකුට වඩා වැඩිදෙනෙක් සමග ඔට්ටු ඇල්ලිය හැකිය. (ඉ) රක්ෂණය කිරීමේදී කෙනෙකුට ලාභ ඉපැයිය නොහැකි නමුත් ඔට්ටු ඇල්ලීමේදී ප්‍රධාන අභිප්‍රාය වන්නේ ලාභ ලබා ගැනීමය. (ඊ) වෙනත් ඕනෑම හෝ වලංගු වෙනස් කමක්.

NOT FOR SALE

1.10

අදාල ඉගෙනුම් ඵලය : 7.1.3
පහත දැකවෙන අවස්ථාවලදී සේවකයකුට ඔහුගේ / ඇයගේ සේවක අර්ථ සාධක අරමුදල් ගිණුමේ තම බැරට ඇති මුදල ආපසු ලබාගත හැකිය. • විශ්‍රාම ගැනීමේ වයසට එළඹ රැකියාවෙන් විශ්‍රාම ගැනීමේදී. • විවාහ වීම නිසා සේවිකාවක් සේවයේ නියුක්තවීම අවසන් කිරීම. • සේවය කිරීමට නොහැකි ලෙස ස්ථිර හෝ සම්පූර්ණ ලෙස සෞඛ්‍ය මය වශයෙන් යෝග්‍ය නොවන බව වෛද්‍ය වරයෙකු විසින් සනාථ කිරීමෙන් පසු සේවකයෙකු/සේවිකාවක සේවයේ නියුක්තවීම නැවැත්වීම. • ස්ථිර පදිංචිය සඳහා විදේශ ගත වීම. • අරමුදලේ ආවරණය ලබන රැකියාවක නියුතු සේවකයකු/සේවිකාවක සේවයෙන් ඉවත්වී රජයේ හෝ පළාත්පාලන ආයතනයක විශ්‍රාම වැටුප් හිමි රැකියාවක් ලබා ගැනීම. • රාජ්‍ය සංස්ථාවක හෝ රජයට අයත් ව්‍යාපාරයක සේවකයකු/සේවිකාවක එහි සේවක සංඛ්‍යාව අඩුකිරීම හේතුකොටගෙන සේවයෙන් ඉවත්කරනු ලැබූ විට ඔහුට/ඇයට හිමි ගිණුමේ මුළු මුදලම ආපසු ලබාගත හැකිය.

[1(b)(MCQs) = මුළු ලකුණු 20]

NOT FOR SALE

<u>2 වන කොටස</u>

<u>පිළිතුර 02</u>

අදාල ඉගෙනුම් ඵලය : 2.4
ව්‍යර්ථ වීම නිසා ගිවිසුමක් අවසන් කිරීමට ගිවිසුම් නීතියේ අවකාශ සපයා ඇත. පහත දැක්වෙන සාධකයන් පවත්නා විට ගිවිසුමක් ව්‍යර්ථවීම සිදුවෙයි. - ගිවිසුම ව්‍යර්ථවීමට මල්වන සිද්ධිය පාර්ශවකරුවන්ගේ පාලනයෙන් ඔබ්බට සිදුවන දෙයක් වීම. - ව්‍යර්ථවීමට හේතුවූ සිද්ධීන් සිදුවූවාට පසුවද පාර්ශවයන් ගිවිසුම ඉටුකිරීමට උත්සාහ කරයිනම් එවිට එසේ ඉටුකරනු ලබන ගිවිසුම එම පාර්ශවයන් මුලින්ම අපේක්ෂාකරගෙන තිබූ ගිවිසුමට වඩා සම්පූර්ණයෙන් වෙනස්වූ එකක් වේ. - ගිවිසුම ව්‍යර්ථවීමට මුල් වූ සිද්ධිය පාර්ශවකරුවන්ගේ වරදකින් තොරව සිදුවීමක් වීම. - ගිවිසුම ඉටුකිරීමට අවශ්‍ය විශේෂිත විෂය වස්තුව විනාශ වීම. - මෙහි සපයා ඇති සිද්ධි මාලාව අනුව කුලී ගිවිසුම ඉටුකිරීමට අවශ්‍ය වන විෂය වස්තුව වන ශාලාව විනාශ වී ඇත. තවද ශාලාව විනාශ වීම එකද පාර්ශවයකවත් වරදක් නිසා සිදුවූවක නොවේ. - මේ නිසා ශාලාව කුලියට දීම සදහා වූ ගිවිසුම ව්‍යර්ථ වීම නිසා අවසන් වී ඇති බව පැවසිය හැකිය. ගිවිසුමට අනුව ගිවිසුමේ පාර්ශවකරුවන් ඔවුන්ගේ වගකීම්වලින් නිදහස් කරනු ලැබීම මෙහි ප්‍රතිඵලය වේ. මේ අනුව මෙම ගිවිසුම යටතේ තමා විසන් කරණ ලද වියදම් වෙනුවෙන් මෙල්මන් ගෙන් වන්දී ඉල්ලා සිටීමට ඇලෙක්ස්ට හිමිකමක් නැත. මෙම සිද්ධි මාලාව යටතේ දැක්වෙන දත්තයන් ටෙයිලර් එදිරිව කොල්ඩ්වෙල් (1983) 122 ER 309) නඩු තීන්දුව හා සමාන වේ. **(මුළු ලකුණු 10)**

NOT FOR SALE

<u>පිළිතුර 03</u>

අදාල ඉගෙනුම් ඵලය : 3.3

සිද්ධි මාලාවෙන් දක්වා ඇති දත්තයන් ග්‍රීන්වුඩ් එදිරිව බෙනෙට් (1973) 1Q.B.195 නඩු තීන්දුවට මෙන්ම රෝලන්ඩ් එදිරිව ඩිවොල් නඩු තීන්දුවට සමාන වේ.

සිද්ධිමාලාවට සම්බන්ධ විෂය වස්තුව එහි හිමිකරු නොවන අයෙකු විසින් කරන ලද අලෙවිකිරීමකට සම්බන්ධවේ.

දක්වා ඇති සද්ධිමාලාව පදනම් කර ගැනීමේදී ඇලෝයිගේ හැසිරීම අනුව මෙම කාර් රථය කිසිවෙකුට විකිණීමට මෝඩිට බලය පවරා ඇති බවට ඉඟි කිරීමට හෝ යෝජනා කිරීමට කිසිදෙයක් නොමැත.

විශේෂිත භාණ්ඩයක අයිතිකරු නොවන කෙනෙකු අයිතිකරුගේ කැමැත්ත හෝ බලය නොමැතිව එම භාණ්ඩ ගැනුම්කරුවකුට අලෙවිකරයි නම් ගැනුම්කරුට හිමිවන්නේ අලෙවිකරුට තිබූ අයිතියම වීම සාමාන්‍ය නියමයයි.

මේ අනුව කිසිම දිනෙක මෝඩි වොක්ස්වෝගන් කාර් රථයේ හිමිකරු බවට පත්වී නැති බැවින් මෙම කාර් රථයේ හිමිකම ස්කැපිට පවරා දීමට හැකි තත්වයක ඔහු නොසිටින බැවින් දක්වා ඇති කිසිම අවස්ථාවක ස්කැපි කිසිම අයුරකින් මෙම කාර් රථයේ හිමිකරු බවට පත් නොවේ.

මේ අනුව දක්වා ඇති සාධක මුල්කරගැනීමේදී කාර් රථයේ අයිතිය තවමත් ඇලෝයි සතුව පවත්නා බව පැවසිය හැකි අතර ඒ අනුව කාර් රථය තම සන්තකයට ලබාගැනීමට ඇලෝයිට හැකිය. වැඩිදුරටත් මෝඩි කාර් රථයේ නියම අයිතිකරු බව සිතන ලද ස්කැපි අහිංසක ගැනුම්කරුකු වන නිසාත්, මෝඩිට කාර් රථය විකිණීමට අයිතියක් නැති නිසාත් කාර් රථය නවීකරණය කිරීමෙන් ලැබෙන වාසිය අයිතිකරු වන ඇලෝයිට ලැබෙන නිසාත් කාර් රථය නවීකරණය කිරීම සඳහා වැයකල රු. 200,000 ක මුදල අයකර ගැනීමට ස්කැපිට අයිතියක් ඇත.

නවීකරණය කිරීමෙන් ලැබෙන වාසිය අයිතිකරු වන ඇලෝයිට ලැබෙන නිසා මෙම මුදල් ප්‍රමාණය ස්කැපිට අයකර ගත හැක්කේ ඇලෝයි ගෙනි.

ස්කැපි විසින් ගෙවන ලද විකුණුම් මිල වන රු. 500,000 ක මුදලද මෝඩිගෙන් ස්ක්‍රැපිට ලබාගත හැකිවන අතර එම මුදල ආපසු ගෙවීමටද මෝඩිට සිදුවේ.

(මුළු ලකුණු 10)

NOT FOR SALE

පිළිතුර 04

අදාල ඉගෙනුම් ඵලය : 5.4

සිද්ධිමාලාවේ දක්වා ඇති සාධක අනුව නියෝජිතයකු ලෙස පෙනටර් මහතා පහත දැක්වෙන යුතුකම් ඉටුකිරීමට අසමත් වී ඇතිබව/ යුතුකම් කඩකර ඇති බව දැකිය හැකිය :

- ප්‍රධානියාගේ උපදෙස් අනුගමනය කිරීමේ යුතුකම.

  තේක්ක ලීයෙන් සාදන ලද පුටු මිලදීගන්නා ලෙසට දී තිබුණ විශේෂ උපදෙස් ඉටුකිරීමට ඔහු අසමත් වී ඇති බැවින් එම යුතුකම පෙන්ටර් මහතා කඩකර ඇත.

- වෘත්තියමය වඩු කාර්මිකයෙකු ලෙස පුටු සාදා ඇත්තේ කුමන ලී වලින් ද යන්න හඳුනා ගැනීමට කුසලතාවයක් ඔහුට තිබිය යුතුය. ඒ බව හඟවනු ලැබීම එයට හේතුවයි.

- තමා සතුව ඇති ප්‍රමාණාත්මක කරුණු (ප්‍රධානියාට) හෙළිදරව් කිරීමේ යුතුකම පෙන්ටර් මහතා උල්ලංඝනය කර ඇත.
  පුටු සාදා ඇත්තේ තේක්ක ලී වලින් නොවන බව ඔහු දැනගෙන සිටි නමුත් එම කරුණ ස්කුයුල් වෙත හෙළිදරව් කර නොතිබීම එයට හේතුවයි.

- නිසි උද්යෝගයෙන් හා සැලකිල්ලකින් ක්‍රියාකිරීමේ යුතුකම පෙන්ටර් මහතා කඩකර ඇත.

  ප්‍රධානියාට තේක්ක පුටු අවශ්‍යව තිබුණ නමුත් පෙන්ටර් මහතා තේක්ක පුටු තිබේදැයි සොයා බැලීමකින් තොරව තේක්ක නොවන ලී වලින් සාදන ලද පුටු තමා පළමුවෙන්ම අතුලු වූ වෙළද සැලෙන් මිලදී ගැනීම එයට හේතුවයි. එබැවින් පෙන්ටර් මහතා නොසැලකිල්ලෙන් කටයුතු කර ඇති බවද පැවතිය හැකිය.

- ප්‍රධානියාගේ උපරිම යහපත සඳහා ක්‍රියාකිරීමට විශ්වාසවන්ත වීමේ යුතුකම පෙන්ටර් මහතා කඩ කර ඇත.

තමා හොඳින් දන්නා කරුණු අනුව ප්‍රධානියාට තෙක්ක ලී වලින් සාදන ලද පුටු විශේෂයෙන්ම අවශ්‍යව තිබුණි. එහෙයින් පෙන්ටර් මහතා තේක්ක පුටු ලබා නොගැනීම නිසා ඔහු එම යුතුකම ඉටුකිරීමටද අසමත්ව ඇත.

(මුළු ලකුණු 10)

NOT FOR SALE

පිළිතුර 05

අදාල ඉගෙනුම් ඵලය : 6.3

බදු කුලී ගිවිසුම අනුව ගෙවිය යුතු බදු කුලී වාරිකයක් ගෙවීමට අසමත් වීම බදු ගැනුම්කරුගෙන් සිදුවූ සැලකිය යුතු අසමත් වීමක් හෝ බදු ගැනුම්කරු (ක්‍රේසි ක්‍රිකට් ක්ලබ්) පාර්ශවයෙන් ඉටු විය යුතු කාර්යයන් කඩවීමක් ලෙස සැලකිය හැකිය.

එවැනි අසමත් වීමක් හෝ කඩකිරීමක් බදු කුලී ගිවිසුම අනුව බදු ගැනුම්කරු විසින් ගෙවීමට එකඟ වූ බදු කුලී වාරිකයක් "ගෙවීම පැහැර හැරීමක්" යයි කියනු ලැබේ.

මේ නිසා මෙම සිද්ධිමාලාවේ 3 වන බදු කුලී වාරිකය ගෙවීමට බදු ගැනුම්කරු වන ක්‍රේසි ක්‍රිකට් ක්ලබ් ගෙවීමට අසමත් වීම මුල්‍ය කුලී බදු පනතට (2,000 අංක 56) සම්බන්ධ නීතිය අනුව ගෙවීම පැහැර හැරීමක් ලෙස වර්ගීකරණය කළ සිදුවීමක් ලෙස සැලකිය හැකිය.

බදු ගැනුම්කරු විසින් පැහැර හැරීමක් සිදු කර ඇති අවස්ථාවකදී බදු දීමනාකරු කකැට් මහතාට ගත හැකි එක්තරා පිලියම් ඇත.

එම පිලියම් පහත පරිදි වේ.

- බදු ගිවිසුම අනුව ලැබිය යුතු මුදල් ගෙවීම කඩිනමින් සිදු කරන ලෙස බදු ගැනුම්කරුට නියම කිරීම.
- බදු ගැනුම්කරු ගෙවීම කඩිනම් කිරීමට අපොහොසත් වුවහොත් ලියාපදිංචි තැපැලෙන් බදු ගැනුම්කරුට දැනුම්දීමක් කිරීමෙන් පසු කුලී ගිවිසම අවසන් කිරීමට / ප්‍රතික්ෂේප කිරීමට බදු දීමනාකරුට හැකි වන අතර;
- ඊට අමතරව බදු වත්කමෙහි සන්තකය උසාවි නියෝගයකින් තොරව හෝ උසාවි නියෝගයක් මගින් ආපසු ලබා ගැනීම.

හෝ

- නැතිනම් බදුගැනුම්කරු විසින් කඩ කිරීමක් නොකර සිටියානම් බදුදීමනාකරු පත්ව සිටිය හැකිව තිබූ තත්ත්වයට බදු දීමනාකරු පත් කිරීමට අවශ්‍ය වන්දි අයකර ගැනීම.

(මුළු ලකුණු 10)

NOT FOR SALE

නිවේදනය

මෙහි ලබාදුන් පිළිතුරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් (ශ්‍රී ලංකා ව.ග.) පමණක් ලබාදෙන ලද අතර, එම පිළිතුරු ඔබ විසින් එය “එසේම”' යන පදනම මත පිළිගත යුතු වේ.

එම පිළිතුරු “ආදර්ශ පිළිතුරු”' ලෙස අදහස් නොකරන නමුත් ඒවා බොහෝදුරට suggested solution ලෙස දැක්වේ.

පිළිතුරු වලින් ප්‍රධාන අරමුණු දෙකක් ඉටුකෙරේ. ඒවා නම්,

01. විභාග ප්‍රශ්නයකට යෝජිත විසඳුමක් සඳහා සවිස්තරාත්මක නිදසුනක් (උදාහරණයක්) සැපයීම සහ,

02. ශිෂ්‍යයන්ට විෂය පිළිබඳව තොරතුරු පර්යේෂණය කිරීම සඳහා අත්වැලක් සැපයීම සහ විෂය පිළිබඳව ඔවුන්ගේ අවබෝධය සහ අගය වර්ධනය කිරීම.

   මෙම යෝජිත විසඳුම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (ශ්‍රී ලංකා ව.ග.) කිසිඳු ප්‍රතිඥාභාරයක් ලබා නොදෙන නිසා ඒ සම්බන්ධව කිසිඳු අගතියකට පත්වීමක් පිළිබඳව මැසිවිල්ලක් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) එරෙහිව ඉදිරිපත් කිරීමට ඔබ හට හේතුවක් නොමැත. ඒ කෙසේ වෙතත් ඔබ විසින් යම් නඩුකරයක්, වන්දි ඉල්ලීමක්, පෙත්සමක්, තර්ජනය කිරීමක් හෝ බලවත් ඉල්ලීමක් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) එරෙහිව ගොනුකරනු ලැබ එයින් සැලකියයුතු අන්දමේ ජයග්‍රහණයක් ලබා නොගතහොත් ඔබ විසින් එම නඩුකරයට අදාළ සම්පූර්ණ නෛතික ගාස්තු සහ වියදම් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) ගෙවිය යුතු වේ. එනයින්ම මෙම අයිතිවාසිකම හෝ මෙහි විස්තර කෙරෙන හෝ ශ්‍රී ලංකාවේ නීතීන් යටතේ හිමි වෙනත් අයිතිවාසිකම් බලාත්මක කරවා ගැනීම සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) නෛතික ක්‍රියාමාර්ගයකට යොමුවීමට සිදුවුවහොත්, ඊට අදාළ නෛතික ගාස්තු සහ වියදම්ද ඔබ විසින් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) ගෙවිය යුතුවේ.

---

2 2013 ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (ශ්‍රී ලංකා ව.ග.) මගිනි.
සියළුම හිමිකම් ඇවිරිණි.

මෙම ලේඛණයේ කිසිම සටහනක් ප්‍රතිඋත්පාදනය කිරීම, කුමන හෝ ආකාරයකින් හෝ ක්‍රමයකින් එනම්, ඉලෙක්ට්‍රොනික, යාන්ත්‍රික, ඡායා පිටපත් කිරීම, වාර්තාගත කිරීම හෝ වෙනත් ක්‍රමයකින් සම්ප්‍රේෂණය කිරීම ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (ශ්‍රී ලංකා ව.ග.) පූර්ව ලිඛිත අවසරයකින් තොරව සිදු නොකළ යුතුය.

NOT FOR SALE